# පුරප්පාඩු

## වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

# පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය

ලෝක බැංකු ණය ආධාර මත වසර පහක කාලයකට ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 ට අනුව ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් වයස අවුරුදු 67 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව, රජයේ නීති රෙගුලාසි පිළිබඳ දැනුම සහ පරිගණක සාක්ෂරතාව අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවයන් වේ.

### 01. ජ්‍යෙෂ්ඨ සිවිල් ඉංජිනේරු - තනතුරු 01

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම සහ අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ වසර 08 ක පළපුරුද්දක් ලබා තිබීම සහ එයින් වසර 4 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමෙහි වීම.

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ පිළිගත් වෘත්තීමය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ එම සුදුසුකම සැපිරීමෙන් අනතුරුව අවම වශයෙන් කළමනාකරණ මට්ටමෙහි අවුරුදු 07 ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

රජයේ දීප ව්‍යාප්ත සේවාවන්හි පළමුවැනි ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයෙහි ඒ හා සමාන තත්ත්වයක් තිබීම සහ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ පළමුවැනි ශ්‍රේණියේ වසර 02 ක පළපුරුද්දක් තිබීම.

**මාසික වැටුප - PS3 – රු. 125,000.00 - 140,000.00***

### 02. පරිසර හා සමාජ ආරක්ෂණ විශේෂඥ - තනතුරු 01
### 03. සන්නිවේදන විශේෂඥ - තනතුරු - 01
### 04. ප්‍රජා සංවර්ධන හා ජීවනෝපාය විශේෂඥ - තනතුරු 01
### 05. ව්‍යාපෘති ගණකාධිකාරී - තනතුරු - 01

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් විශ්වවිද්‍යාල උපාධියට සමාන යැයි පිළිගනු ලබන අධ්‍යාපන සුදුසුකම් මෙම විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා තිබීම හෝ එම විෂය ක්ෂේත්‍රය පිළිබඳ පිළිගත් වෘත්තීමය ආයතනයක අවසාන මට්ටමේ විභාගය සමත්වීම සහ එම අධ්‍යාපන සුදුසුකම් සපුරාලීමෙන් පසුව අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 06 ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

රජයේ දීප ව්‍යාප්ත සේවාවන්හි III/II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයක ඒ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම සහ අවම වශයෙන් III/II ශ්‍රේණියේ තනතුරක වසර 06 ක පළපුරුද්දක් ලබා තිබීම.

සන්නිවේදන විශේෂඥ තනතුර සඳහා අයදුම්කරුවන් සතුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන සන්නිවේදනය, පුවත්පත් කලාව සහ ජනසන්නිවේදන ක්ෂේත්‍රයේ උපාධියක් හෝ සන්නිවේදන විෂයය ඇතුළත් උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක සුදුසුකම් සපුරාලීමෙන් පසුව පළපුරුද්ද තිබිය යුතුය. මෙයින් වසර 03 ක් කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**මාසික වැටුප - PS4 - රු. 100,000.00 - 115,000.00***

### 06. පරිසර නිලධාරී - තනතුරු - 02
### 07. සමාජ සංවර්ධන නිලධාරී - තනතුරු - 01

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් හත්වන (07) මට්ටමේ ජාතික වෘත්තීය කුසලතා (NVQ) සහතිකයක් ලබා තිබීම සහ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව වසරක (01) විශේෂ පළපුරුද්දක් ලබා තිබීම

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් හයවන (06) මට්ටමේ ජාතික වෘත්තීය කුසලතා (NVQ) සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයෙහි වසර 6 ක විශේෂ පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් පස්වන (05) මට්ටමේ ජාතික වෘත්තීය කුසලතා (NVQ) සහතිකයක් ලබා තිබීම සහ ප්‍රසම්පාදන කටයුතුවල අදාළව වසර 11 ක විශේෂ පළපුරුද්දක් ලබා තිබීම.

**මාසික වැටුප - PS6 - රු. 58,000.00 - 63,000.00***

### 08. ව්‍යාපෘති ලේකම්

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

අ.පො.ස. සා/පෙළ විභාගයෙන් ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ භාෂාවද ඇතුළුව විෂයන් 3 කට සම්මාන සහිතව එකවර විෂයන් 06 ක් සමත් වීම සහ පිළිගත් ආයතනයකින් ලේකම් පරිචය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම හෝ වරලත් ලේකම්කරණ පරීක්ෂණ සමත් වීම සහ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 3 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

වරලත් ලේකම්වරයෙකු ලෙස අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම.

**මාසික වැටුප - PS6 - රු. 58,000.00 - 63,000.00***

* MSD චක්‍රලේඛ අංක 01/2019 අනුව ඉහත සඳහන් වැටුපට අමතරව ජීවන වියදම් දීමනා ගෙවනු ලැබේ.

**අයදුම් කිරීම :**

අයදුම්කරුවන් විසින් ඥාතීන් නොවන ඔහු / ඇය පිළිබඳ නිර්දේශයන් ලබාගත හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන්ද ඇතුළත්ව තම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සඳහන් කරමින් සිය ජීව දත්ත පත්‍රිකාවත් අයදුම්පත සමග යොමු කළ යුතුය. සුදුසුකම් හා සේවා පළපුරුද්ද පදනම් කර ගනිමින් ඉහළම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් සිදුකරන අතර, අයදුම්කරුවන්ගේ කුසලතාවන්ගේ ප්‍රමුඛතාවය මත බඳවා ගැනීම් සිදු කරනු ලබයි. එබැවින්, බඳවා ගැනීමේ ක්‍රියාවලිය සඳහා කිසියම් බලපෑමක් හෝ නියෝජනයක් කිරීම මගින් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය. මූලික සුදුසුකම් තහවුරු කරගැනීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවීම අනිවාර්ය වන අතර, සියලුම අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනට රජයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා / ආයතන ප්‍රධානියා හරහා, සම්පූර්ණ කළ අයදුම්පත් **2021 මාර්තු 08 වන දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහා එවන ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සටහන් කළ යුතුය.

තනතුරට අදාළ රාජකාරී විස්තරය සඳහා www.msdw.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

**ලේකම්,**
**වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය,**
**අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.**
**2021 පෙබරවාරි 19 වන දින**